ප්‍රසම්පාදන දැන්වීමයි

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

කිරින්ද ධීවර වරාය භූමියේ ගොඩගසා ඇති මුහුදු වැලි කියුබ් 11,100 ක් නිර්දේශිත වෙරළ තීරය වෙත බැහැර කිරීම සහ තුනී කිරීම සඳහා ලංසු කැඳවීම (දෙවන අදියර)

ප්‍රසම්පාදන අංකඃ CFHC/PD/SAND/KIR/2026/121

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙනුවෙන් සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් කිරින්ද ධීවර වරාය භූමියේ ගොඩගසා ඇති මුහුදු වැලි කියුබ් 11,100 ක් කිරින්ද ධීවර වරායේ සිට ගුරුගොඩ ගවර්නස් කෑම්ප් හෝටලය අසලින් පිහිටි වෙරළ තීරය වෙත පැටවීම, ප්‍රවාහනය කිරීම සහ තුනී කිරීම සඳහා යෝග්‍යතා පූර්ණ සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. වැඩකරන දින 120 ක් ඇතුළත ව්‍යාපෘතිය අවසන් කල යුතුය.

මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා වන අයදුම් පත්‍රය ප්‍රධාන කාර්යාලයෙන් හෝ කිරින්ද ධීවර වරායේ මුදල් අයකැමි වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රු.5000.00 ක මුදලක් ගෙවා (ආපසු නොගෙවනු ලබන) ලංසු පත්‍රිකා 2026.10.21 දින සිට 2026.11.09 වෙනි දින දක්වා පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා (කාර්යාලීය වේලාව තුළ) ලබා ගත හැකිය. මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී රු.300,000.00 ක ලංසු ඇපකරයක් (Bid Bond) මුදලින් හෝ බැංකු ඇපකරයක් මගින් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. 2026.11.10 දින සිට කැලැන්ඩර් දින 91 ක කාලයකට වලංගු වන ලංසු ඇපකරයක් ලංසුකරු විසින් ලංසු ඉදිරිපත් කිරීමේ දී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට ලබා දීමට බැඳී සිටින අතර අදාල බැඳුම්කරය ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත වාණිජ බැංකුවකින් ලබා ගන්නා ලද කොන්දේසි රහිත පළමු ලිඛිත ඉල්ලීම මත ගෙවීමේ හැකියාව ඇති සභාපති, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,අංක 15, රොක්හවුස් පටුමග, කොළඹ 15 නමට යොමු කරන ලද බැඳුම්කරයක් විය යුතුය. ප්‍රදානය කිරීමේ ලිපිය නිකුත් කර දින 14 ක කාලය තුළ අදාළ කාර්ය භාර ගැනීමට අපොහොසත් වන අවස්ථාවක දී අදාළ බැඳුම්කරය මත මුදල් අයකර ගැනීමේ අයිතිය ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව සතුය.

ලංසු පත්‍රිකා භාර ගන්නා අවසාන දිනය 2026.11.10 දින පෙ.ව 11.00 වන අතර අදාළ ලංසු පත්‍රිකා කොළඹ-15, රොක්හවුස් පටුමග, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ 2 වන මහලේ පිහිටි ප්‍රසම්පාදන අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතුය. නැතහොත් ඉහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.11.10 දින පෙ.ව 11.00 ට ප්‍රථම එවිය යුතුය. ලංසු පත්‍රිකා විවෘත කිරීම 2026.11. 10 දින පෙ.ව 11.00 ට ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයේ දී සිදු කරනු ලැබේ. එම අවස්ථාවට මිල ගණන් ඉදිරිපත් කළ අයට හෝ ඔවුන්ගේ නියෝජිතයෙකුට සහභාගි විය හැක. 2026.11. 10 දින පෙ.ව 11.00 ට පසුව ලැබෙන ලංසු පත්‍රිකා භාරගනු නොලැබේ.

මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"කිරින්ද ධීවර වරාය භූමියේ ගොඩගසා ඇති මුහුදු වැලි නිර්දේශිත වෙරළ තීරය වෙත බැහැර කිරීම සහ තුනී කිරීම සඳහා මිල ගණන් කැඳවීම (දෙවන අදියර "** යනුවෙන් සඳහන් කර 2026.11.10 දින පෙ.ව. 11.00 ලෙස ද සඳහන් කළ යුතුය.

කොන්තත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලබන ලංසුකරු අසාදු ලේඛන ගත නොවිය යුතුය.

ප්‍රසම්පදෙන ලේඛන පිටපත් දෙකකින් මුල් පිටපත සහ අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර තනි කවරයකට බහා ඉදිරිපත් කළයුතුය.

වැඩි විස්තර වැ.බ. ප්‍රසම්පාදන කළමණාකාර (0112-525063), කළමනාකාර - සිවිල් ඉංජිනේරු (0112529391), වරාය කළමණාකාර-කිරින්ද (047-3489378) ඇමතීමෙන් වෙතින් ලබාගත හැක.

පූර්ව ලංසු රැස්වීම 2026.10.30 වන දින පෙ.ව.11.00 ට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථා ප්‍රධාන කාර්යාලයේ පළමු මහලේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේ දී පැවැත්වේ.

මිල ගණන් භාර ගැනීම ප්‍රදානය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ලංකා ධීවර වරාය නීගිගත සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව සතුය.

සභාපති,
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංකඃ15, රොක්හවුස් පටුමග,